**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම**

**අවසාන විභාගය - 2020/2021 (මාර්ගගත )**

**ඉඩම් නීතිය -LLU5810/LWU3312**

**කාලය -පැය 3**

---

දිනය: 2021 සැප්තැම්බර් 06 | වේලාව: පෙ.ව. 9.30 සිට ප.ව.12.30

---

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 05**

**පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව : 04**

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

1. 2003 දී නෙවිල්, උඩකුඹුර නම් ඉඩම ජයසේනට උකස් කළ අතර වසර 2006 දී මෙම උකස්කරය නිදහස් කර ගත යුතුව තිබුණි. ජයසේන ඇප සුරැකුමක් ලෙස උඩකුඹුරේ භුක්තිය ලබා ගත්තේය. නෙවිල් 2005 වසරේදී මිය ගිය අතර උඩකුඹුරද ඇතුළත්ව ඔහුගේ සියලුම දේපල බිරිඳ වන කාන්තිට සහ අවුරුදු 10 ක පුතුට උරුම විය. සිය සැමියාගේ මරණයෙන් පසු, පුතා සිය දෙමව්පියන් භාරයේ තබමින් කාන්ති කුවේට් හි රැකියාවකට පිටත්ව ගියාය. 2009 වසරේදී කාන්ති ලංකාවට පැමිණියත් උඩකුඹුර බැලීමට නොගියාය. වසර 2003 සිට ජයසේන නොකඩවාම උඩකුඹුර අස්වැද්දුවේය. 2010 දී කාන්තිගේ සොහොයුරා උකස ගෙවා අවසන් කිරීමට උත්සහා කළත් උකස නිදහස් කිරීම කාන්ති විසින්ම විය යුතු බව පවසමින් ජයසේන මුදල් භාර ගැනීම ප්‍රතික්ෂේප කළේය. 2011 දී කාන්තිගේ සොහොයුරා මැරයන් යොදා සති 2ක් තුළ උඩකුඹුර නැවත භාර නොදුන්නොත් ජයසේන මරණ බවට තර්ජනය කළේය. මීට බියෙන් ජයසේන තම මාමගේ නිවසේ පදිංචියට ගිය අතර කන්න 3 ක් උඩකුඹුර අස්වැද්දවීම මඟ හැරියේය. තර්ජන වලින් පසුවද කාන්ති හෝ ඇගේ සොහොයුරා උඩකුඹුර අස්වැද්දවීමට හෝ එහි පදිංචිවීමට කටයුතු නොකළෝය. 2012 අග භාගයේදී ජයසේන නැවත පැමිණ උඩකුඹුරේ පදිංචි වී එය අස්වැද්දුවේය. වසර 2015 දී කාන්ති ලංකාවට පැමිණීමෙන් පසු උකස් මුදල් ගෙවා ඉඩම ලබා ගැනීමට ජයසේනගෙන් ඉල්ලීමක් කළත් ඔහු උඩකුඹුර නැවත ලබා දීම ප්‍රතික්ෂේප කළේය. කාන්ති තමාගේ සහ දරුවා වෙනුවෙන් ඉඩමේ හිමිකම් තහවුරු කරගැනීමට නඩුවක්

පැවරුවාය. ජයසේන අධිකරණයේදී කියා සිටියේ තමාට මුළු ඉඩම සඳහාම කාලවරෝධය යටතේ අයිතියක් ඇති බවයි.

2021 වසරේදී මෙම නඩුව විසඳන විනිසුරුවරයා ඔබ යැයි උපකල්පනය කරන්න. අදාළ අධිකාරීන් සහිතව ඔබ විසින් ලබා දෙන තීරණය ලියා දැක්වීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

(ලකුණු 25)

2. අදාළ නඩු තීරණ දක්වමින් පහත සඳහන් අවස්ථා සාකච්ඡා කරන්න.

(I) නිහාල්, වසර 20 කට වැඩි කාලයක් තිස්සේ සුනිමල්ගේ ඉඩම මතින් ඇති අඩි 6 ක පාර භාවිතා කරමින් ප්‍රධාන මාර්ගයට ප්‍රවේශ වේ. මෑතකදී නිහාල් කාරයක් මිලදී ගත් අතර ඔහුට දැනට පවතින පාර මතින් කාරය ධාවනය කළ නොහැකි බැවින් පවතින අඩි 6 ක පාර අඩි 10 ක පාරක් දක්වා පුළුල් කිරීමේ හැකියාව සොයයි.

(II) ගයාන්ගේ නිවස, මායිම් බිත්තියකින් සමන්විතවන අතර එම මායිම් බිත්තිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඔහුගේ අසල්වැසි රියාස් ගේ ඉඩමේ පලංචි දැමීමට ගයාන්ට අවශ්‍යය.

(III) කමල් වසර 15 කටත් වැඩි කාලයක් තිස්සේ වමල්ගේ ඉඩමට මතින් ඇති අඩි 6 ක් පළල මාර්ගයක් භාවිතා කරමින් ප්‍රධාන මාර්ගයට ප්‍රවේශ වේ. කමල් සිය පවුල සමඟ ඔහුගේ පශ්චාත් උපාධිය සඳහා වසර 3 ක් ඕස්ට්‍රේලියාවට ගියේය. කමල් නැවත ලංකාවට පැමිණි විට නිරීක්ෂණය කළේ, කමල්ගේ නිවසට එකම පිවිසුම ලබා දුන් මාර්ගය අවහිර කරමින් තාවකාලික ගොඩනැගිල්ලක් වමල් ඉදිකර ඇති බවයි.

(IV) සිරිසේනට හික්කඩුවේ වෙරළට සමීපව නිවසක් ඇති අතර අසල්වැසි පෙරේරාගේ හිස් ඉඩම හරහා ඔහු වසර 25 ක කාලයක් මුහුදේ සුන්දර දසුනක් භුක්ති විඳිමින් සිටියි. සිරිසේන පෙරේරාගේ ඉඩම හරහා පවතින අඩි පාරක් ද වෙරළට පැමිණීමට භාවිතා කළේය. තම ඉඩමේ බහු මහල් හෝටලයක් ඉදිකිරීමේ අදහස පෙරේරා

මැතකදී පෙන්නුම් කළ අතර මෙම ඉදිකිරීම මඟින් ඔහුගේ මුහුදු දර්ශනය, වාතාශ්‍රය, හිරු එළිය සහ වෙරළට ප්‍රවේශ වීම අවහිර වන බවට සිරිසේන බිය වේ.

(V) ප්‍රියාල්ට ඔහුගේ දෙමව්පියන්ගෙන් හිස් ඉඩමක් උරුම වූ අතර, හතර වටින් කොටු වූ මෙම ඉඩමට කිසිඳු මාර්ග අයිතියක් ලියාපදිංචි ඔප්පුව මඟින් ලබා දී නැත.

(ලකුණු 25)

3. කුරුණෑගල පිහිටි පර්චස් 150 ක ඉඩමක හිමිකරු වන නිමල් වසර 2014 දී, වසර 3 ක කාලයකට තම ඉඩම ප්‍රසන්න නැමති වඩු කාර්මිකයෙකුට බද්දට ලබා දුන්නේය. මෙම ඉඩම බද්දට ලබා දෙන අවස්ථාවේදී එම ඉඩමේ කොටසක කෝපි වගාවක්ද සිදු කොට තිබුණි. අවශ්‍ය වුවහොත් බදු කාලය නැවත දීර්ඝ කිරීමට හැකි බවට වාචික එකඟත්වයක්ද නිමල් සහ ප්‍රසන්න අතර තිබුණි. ප්‍රසන්න මෙම ඉඩම බද්දට ගැනීමෙන් අනතුරුව තමාගේ වඩු වැඩ කරගෙන යාමට අවශ්‍ය පරිදි යකඩ කණු මත සවිකළ තහඩු වහලයක් සහිත ගොඩනැගිල්ලක් ඉදි කළේය. ගොඩනැගිල්ලේ ඉදිරිපස කුඩා කොටසක් කඩ කාමරයක් ලෙස වෙන් කල ප්‍රසන්න එය විදුරු වලින් ආවරණය කළේය. මීට අමතරව ඉඩමේ ගේට්ටුව ආසන්නයේ කලාත්මක කැටයම් යෙදූ ලී නිර්මාණයක් සිමෙන්ති පවුරුවක් මත සවි කළේය.

වගාකාරිනියක් වූ ප්‍රසන්නගේ බිරිඳ නිලන්ති ඉඩමේ පවතී කෝපි වගාව තව දුරටත් පුළුල් කරමින් 2015 දී ඉඩමේ කොටසක ඕකිඩ් මල් වගාවක්ද ආරම්භ කළාය. වගාවන්ට අවශ්‍ය වතුර ලබා ගැනීම වෙනුවෙන් වතුර විදීමේ බට පද්ධතියක් සහ ටයිල් ඇතිරූ වතුර ටැංකියක්ද ඉඩමේ ගොඩ නැගුවේය. වසර 2016 වන විට ප්‍රසන්නගේ මෙම වඩු වැඩ පොලෙහි අධික ශබ්දයක් පැවතීම සහ එමඟින් පරිසරයට හානි වන බව දක්වමින් අසල්වාසීන් නිමල් වෙත දොස් පැවරීම ආරම්භ විය. අසල්වාසින්ගෙන් නිරන්තරව පැමිණෙන පැමිණිලි නිසා මානසික පීඩාවට පත් නිමල්, බදු කාලය අවසන් වූ වහාම මෙම ඉඩමෙන් ඉවත්ව යන ලෙසට වසර 2017 දී ප්‍රසන්නගෙන් ඉල්ලා සිටියේය. තමාට තවත් වසර 3 ක් සඳහා මෙම ඉඩම බද්දට ලබා දෙන ලෙස ප්‍රසන්න ඉල්ලා සිටියත් නිමල් එම ඉල්ලීමට එකඟ නොවී ඉඩමෙන් පිටත්ව යන ලෙස ප්‍රසන්නට දන්වා සිටියේය. එවිට ප්‍රසන්න තමා විසින් සිදු කළ වැඩිදියුණු කිරීම් සහ වගාවන් සඳහා වන්දි ඉල්ලා සිටි නමුත්, නිමල් වන්දි ගෙවීම

ප්‍රතික්ෂේප කරමින් කියා සිටියේ වැඩි දියුණු කිරීම් ඉඩමේ කොටසක් බවට පත්ව ඇති බවයි. සියලුම වැඩිදියුණු කිරීම් සඳහා තමාට වන්දි ලබා දෙන තුරු ඉඩමෙන් පිටවීම ප්‍රසන්න ප්‍රතික්ෂේප කරයි.

(I) ඉඩම් නීතියේ සංකල්ප කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් සාකච්ජා කරන්න.

(ලකුණු 15 )

(II) වසර 2016 දී අසල්වාසීන්ගේ පැමිණිලි නිසා නිමල් විසින් ප්‍රසන්නව ඉඩමෙන් පිටමන් කිරීමට උත්සාහ කළේ යැයි උපකල්පනය කරන්න. එවන් අවස්ථාවකදී ප්‍රසන්නට ඉඩම් නීතිය යටතේ ලබා ගත හැකිව පැවති ප්‍රතිකර්මය කුමක්දැයි විස්තරාත්මකව දක්වන්න. (ලකුණු 10)

4. A සහ B කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

**<u>A කොටස</u>**

"පසෙහි සෑම අඟලකම නොබෙදුණු කොටසක් සඳහා සම අයිතිකරුවෙකුට අයිතියක් බව" නීතිය පිළිගන්නා හෙයින් ඉඩම් නීතියේ සාමාන්‍ය මූලධර්ම සෑම විටම සම අයිතිකරුවන්ට වෙනස් ලෙස අදාළ වේ.''

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද?

ඉඩම් නීතියේ **<u>අංශ දෙකක්</u>** පමණක් තෝරා ගෙන ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. අදාළ නඩු තීරණ ඔබගේ පිළිතුර සඳහා සහාය කර ගත යුතු වේ.

(ලකුණු 17 )

**<u>B කොටස-</u>** අදාළ නඩු තීරණ දක්වමින් පහත සඳහන් අවස්ථා සාකච්ජා කරන්න.

(I) ශාන්ත, වර්ෂ 2018 දි රුපියල් මිලියන 3ක මුදලක් ලබා ගැනීමට, තමාට තවමත් නිසි පරිදි උරුම නොවූ පර්චස් 40 ක ඉඩමක් උකසට යටත් කර සිල්වා සමඟ උකසක් ඇති කර ගනී. දෙමව්පියන් මිය යාමත් සමඟ මෙම ඉඩම වර්ෂ 2020 දී ශාන්තට උරුම විය. උකස් කාලය අවසානයේ නිසි පරිදි උකස පියවා අවසන්

නොකිරීම මත උකස් නඩුවකට යාමට පවතින හැකියාව පිළිබඳ සිල්වා සොයා බලමින් සිටි. (ලකුණු 04 )

(II) නිසිපරිදි ලියා පදිංචි කරන ලද උකස් ඔප්පුවකට යටත්ව තම ඉඩම ලංකා බැංකුවට උකස් තබා රුපියල් මිලියන 6ක් ලබා ගත් ප්‍රසාද් 2015 දී ඇඳුම් ව්‍යාපාරයක් ආරම්භ කළේය. උකස් ගෙවීමේ කාලය වසර 6 ක් වූ අතර ප්‍රසාද්ගේ අසනීප තත්වයන් මත ඔහුගේ ව්‍යාපාරය කඩා වැටුණි. වසර 6 අවසානයේ උකස නිසි පරිදි ගෙවා අවසන් කිරීමට ප්‍රසාද් ට නොහැකි විය. මෙම මුදල අය කර ගැනීමට ඇති පහසුම ක්‍රමය පිළිබඳ ලංකා බැංකුව කරුණු සොයමින් සිටි.

(ලකුණු 04 )

5.

(I) "තමාගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් නිසි අවධානය සහ උනන්දුව ඇතිව නිසි පරිදි අදාල ඔප්පු ලියා පදිංචි කිරීමට කටයුතු කරන පුද්ගලයන්ට **සම්පූර්ණ ආරක්ෂාවක්** 1927 අංක 23 දරණ ලේඛන ලියා පදිංචි කිරීමේ ආඥපනතින් ලබා දේ".

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීරණ ඇසුරෙන් විවේචනාත්මකව විස්තර කරන්න.

(ලකුණු 15 )

(II) ලේඛන ලියාපදිංචි කිරීමේ ක්‍රමයේ තිබූ සියලුම අඩුපාඩුකම් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත මඟින් නිවාරණය කළ බව ඔබ සිතන්නේද, නැත්නම් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත තවදුරටත් ශක්තිමත් කිරීමට ඔබ යෝජනා කරන යම් නිර්දේශයන් තිබේ ද? හේතු පැහැදිලි කරමින් ඔබගේ පිළිතුර දක්වන්න.

(ලකුණු 10)

- *සියලුම හිමිකම් ඇවිරිණි* -